ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | **ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව** |
|---|---|
| දිනය | **2012.11.12** |

## ශ්‍රී ලංකා ජපාන රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවයට හැට වසරක් පිරීම සැමරීම නිමිත්තෙන් නිකුත් කරනු ලබන සමරු කාසිය

- ශ්‍රී ලංකා ජපාන රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවයට හැට වසරක් පිරීම සැමරීම නිමිත්තෙන් රුපියල් 1000 මුහුණත වටිනාකමෙන් යුත් රිදී සමරු කාසියක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ඇත. ජපාන රජයේ ඉල්ලීම පරිදි ජපන් මින්ට් ආයතනය විසින් ටංකනය කරන ලද මෙම කාසිය ශ්‍රී ලංකා මහ බැංකුවේ 57 වන සමරු කාසියයි. මෙම කාසිය 2012 නොවැම්බර් 12 වන දින ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත නිල වශයෙන් නිකුත් කෙරේ.

  කාසියේ ලක්ෂණ

මුහුණත




* ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය බහුවර්ණයෙන් දැක්වේ.
* කාසියේ පහළ “2012” වර්ෂය ද “ශ්‍රී ලංකාව - ජපානය වසර 60 යි” යන්න සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පරිධියේ ද දැක්වේ.

පිටුපස




* 60 වන සංවත්සර නිල ලාංඡනය කාසිය මධ්‍යයේ දැක්වේ.
* කාසියේ මුහුණත වටිනාකම වන රුපියල් “1000” සහ “රුපියල්” යන්න කාසියේ පහළ ද “ශ්‍රී ලංකා” යන්න සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පරිධියේ ද දැක්වේ.

- කාසියේ විෂ්කම්භය මිලි මීටර් 35 ක් වන අතර බර ග්‍රෑම් 20.0 ක් වේ.

- කාසිය ආකර්ෂණීය ඇසුරුමක බහා ජපන් මින්ට් ආයතනයේ සත්‍යතා සහතිකයක් ද සමඟ නිකුත් කරනු ලැබේ.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් කාසියක් රුපියල් 12,500 බැගින් සීමිත කාසි ප්‍රමාණයක් අලෙවි කරනු ලබන අතර 2012 නොවැම්බර් 15 වන දින සිට කොළඹ 1 ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙන්ද, රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු විදුපියසේ ස්ථාපිත මුදල් කෞතුකාගාරයෙන් ද, අනුරාධපුර, මාතර, මාතලේ, යාපනය හා ත්‍රිකුණාමලයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු පළාත් කාර්යාල වලින් ද මෙම කාසිය මිලදී ගත හැකිය.

- මෙම සමරු කාසිය තනිව හෝ එම කාසිය ඇතුලුව තවත් ජපන් කාසි 6 කින් සමන්විත කාසි කට්ටලයක් ජපන් මින්ට් ආයතනය විසින් අලෙවි කරනු ඇත. (වැඩි විස්තර සඳහා www.mint.go.jp වෙබ් අඩවිය බලන්න).

- **වැඩි විස්තර සඳහා:**

| | | **දුරකථන අංකය** | **ෆැක්ස් අංකය** |
|---|---|---|---|
| ව්‍යවහාර මුදල් අධිකාරී | - | 0112477355 | 0112477726 |
| ජ්‍යෝෂ්ඨ සහකාර අධිකාරී/ ව්‍යවහාර මුදල් | - | 0112477130 / 0112477364 | |
| විද්‍යුත් තැපෑල | - | currency@cbsl.lk | |
| මුදල් කෞතුකාගාරය, රාජගිරිය | - | 011 2477809 | |
| පළාත් කාර්යාල | | | |
| අනුරාධපුරය | - | 025 2222048 | 0252225689 |
| මාතර | - | 041 2222268 | 0412222719 |
| මාතලේ | - | 066 2223367 | 0662222175 |
| යාපනය | - | 021 2221855 | 0212221857 |
| ත්‍රිකුණාමලය | - | 026 2242333 | 0262242332 |

අධිකාරී

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

අංක 30, ජනාධිපති මාවත

කොළඹ 1.